**පියවීම් සහතික කිරීමේ අරමුදල - 2016**

-----------------------------------------------

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත ප්‍රකාර ඇතිකරන ලද පියවීම් සහතික කිරීමේ අරමුදල සම්බන්ධයෙන් වූ 1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 11(ඇ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---------------------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.59,400,435 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.36,068,602 ක් වූයෙන් රු.23,331,833 ක මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් දැක්වුණි. මේ සඳහා හේතු වූයේ පොළී ආදායම වැඩිවීමයි.

3.2 අරමුදල

---------

3.2.1 අරමුණු

----------

අරමුදලෙහි අරමුණු වන්නේ,

(අ) මධ්‍යම කොටස් තැන්පතු නිශ්කාශන හා නිරවුල් කිරීමේ පහසුකම සැපයීමේ කාර්යයේ යෙදී සිටින ආයතනයක් ලෙසින් නොකඩවා කටයුතු කරමින්, මධ්‍යම තැන්පතු පද්ධතියේ නිශ්කාශන සාමාජිකයින් අතර ඇතිවන වෙළඳ ගනුදෙනු නිරවුල් කිරීම සහතික කිරීමේ අරමුණින් අරමුදල් එකතු කිරීම හා සැපයීම ( භාරකරුවන්ගේ පූර්ණ අභිමතය පරිදි) හා ,

(ආ) සීමාවකින් තොරව ඉහත (අ) හි සඳහන් අරමුණු සහ පරමාර්ථ ඉටුකරගැනීම උදෙසා සියළුම අවදානම් සහිත ව්‍යාපාර පවරාගැනීම සහ වෙනත් සියළු ක්‍රියාමාර්ග හා කටයුතු සිදුකිරීම සඳහා භාරගැනීමයි.

3.2.2 කාර්යයන්

------------

1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 5(අ) ඡේදය පරිදි මධ්‍යම තැන්පතු පද්ධතියේ නිශ්කාශන සාමාජිකයින් අතර අර්බුද වාර්තා වී නොතිබුණ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු වන්දි ගෙවීමක් සිදුකර නොතිබුණි.